Department Sabaragamuwa Province/ Weekly School Department of Education, Sabaragamuwa Province/ Weekly School Department of Education, Sabaragamuwa Province/ Weekly School

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව - සති පාසල

විෂය-ව්‍යාපාර සංඛ්‍යානය

සතිය- 1

ශ්‍රේණිය-12

සකස් කළේ - රත්නපුර කලාප අධ්‍යාපන කාර්යාලය

නිපුණතාව 1.0 - ව්‍යාපාර සංඛ්‍යානය විෂයයෙහි විෂය පථය සහ එහි ස්වභාවය අධ්‍යයනය කරයි.

නිපුණතා මට්ටම 1.1 - ව්‍යාපාර සංඛ්‍යානය සහ එහි සීමා විමර්ශනය කරයි.

## සංඛ්‍යානය -

විවිධ විෂයන් සම්බන්ධයෙන් දත්ත රැස් කිරීම,ඒවා සංවිධානය කිරීම,දත්ත ඉදිරිපත් කිරීම සහ ඒවා විශ්ලේෂණය හා අර්ථකථනය තුළින් නිගමනවලට එළඹීමේ ශිල්පීය ක්‍රම පිළිබඳව අධ්‍යයනය කිරීමයි.

## සංඛ්‍යාන අධ්‍යයනයක පියවර-

1.අදාළ දත්ත රැස් කිරීම.
2.සංවිධානය හා ඉදිරිපත් කිරීම.
3.දත්ත විශ්ලේෂණය හා අර්ථකථනය කිරීම.
4.නිගමනවලට එළඹීම.

## සංඛ්‍යානයේ කාර්යභාරය

1.කරුණු නිශ්චිත ආකාරයට ඉදිරිපත් කිරීම.
2.සංකීර්ණ දත්ත තේරුම් ගැනීමට පහසුවන ආකාරයට සරලව දැක්වීම.
3.සැසඳීමේ ශිල්ප ක්‍රමයක් වීම.
4.පුද්ගල අත්දැකීම් පුළුල්ව හා විද්‍යානුකූලව විශ්ලේෂණය කළ හැකි වීම.
5.ප්‍රතිපත්ති සම්පාදනයට මග පෙන්වීම.
6.කිසියම් සංසිද්ධියක තරම ප්‍රමාණනය කළ හැකි වීම.
7.හේතු ඵල සම්බන්ධතා මතු කර දැක්වීමට උපකාරී වීම.

## අභ්‍යාස

1.සංඛ්‍යානයේ සීමා 5ක් දක්වන්න.
2.සංඛ්‍යානයේ වැදගත්කම පැහැදිලි කරන්න.
3.අනුමිතික සංඛ්‍යානය යනු කුමක්ද?
4.සංඛ්‍යානයේ අවභාවිත 3ක් දක්වන්න.